www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂය කීර්ති බාලසූරිය සහෝදරයාගේ අභාවයේ 18 සංවත්සරය ස්මරනය කරයි

**Sri Lanka SEP to commemorate anniversary of Keerthi Balasuriya's death**

**2005 දෙසැම්බර් 29**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය තම පූර්ව ප්‍රාප්තික විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ ආරම්භක ප්‍රධාන ලේකම් වූ කීර්ති බාලසූරිය සහෝදරයාගේ අභාවයෙන් දහඅටවන සංවත්සරය අනුස්මරනය කිරීම සඳහා ප්‍රසිද්ධ දේශනයක් පවත්වනු ඇත.

1987 දෙසැම්බර් 18 දින යන්තම් අවුරුදු 39 දී කීර්ති බාලසූරිය සහෝදරයා හදිසි හෘදයාබාධයකින් අභාවප්‍රාප්ත විය. ඔහුගේ අකාල මරනය විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයට ද සමස්ත වසයෙන් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට ද බලවත් පාඩුවක් විය.

කීර්ති බාලසූරිය සහෝදරයා 1964 දී සිරිමාවෝ බන්ඩාරනායකගේ ධනේශ්වර ආන්ඩුවට එකතු වූ ලංකා සමසමාජ පක්ෂයේ පාවාදීමට එරෙහිව හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගෙන ගිය දේශපාලන හා න්‍යායික අරගලය තුල ප්‍රමුඛ ක්‍රියා කලාපයක් ඉටු කලේ ය. ලංකා සමසමාජ පක්ෂයේ පාවාදීම ශ්‍රී ලංකාවේ ද දකුනු ආසියාවේ ද ජාත්‍යන්තරව ද කම්කරු පන්තියට බරපතල ප්‍රතිවිපාක අත් කර දුනි. සමාජවාදී ජාත්‍යන්තරවාදය මත පදනම්ව කම්කරුවන් ඒකාබද්ධකිරීම සඳහා අරගලය අතහැර දැමීම මගින් ලංකා සමසමාජ පක්ෂය ප්‍රජාගනවාදය මත පදනම් වූ රැඩිකල් මධ්‍යමපන්තික ව්‍යාපාරවලට දොර හැර දී දිවයිනේ ව්‍යසනකාරී සිවිල් යුද්ධයට මග පාදා දුන්නේ ය.

කීර්ති බාලසූරිය 1968, වයස අවුරුදු 19 දී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ ආරම්භක ප්‍රධාන ලේකම් ලෙස පත් විය. ඔහු තමාගේ මුලුමහත් වැඩිහිටි ජීවිතයම සෑම වර්ගයේම දේශපාලන අවස්ථාවාදයට එරෙහිව අරගලයක් මගින් මාක්ස්වාදී මූලධර්ම මත පදනම් වූ විප්ලවවාදී පක්ෂය ගොඩනැගීමට යෙදවිය. ඔහු බෙහෙවින් උත්සුක වූ එක් කරුනක් නම් අද දින ලෝක කම්කරු පන්තියට ඉමහත් අදාල බවක් දරන්නා වූ 1964 ලසසපය පාවාදීමේ දේශපාලන පාඩම් තහවුරු කර ලීම ය.

"ලංකා සමසමාජ පක්ෂයේ 70 වසරක් - එහි නැගීම හා වැටීම" යන තේමාව මත කෙරෙන මෙම දේශනය සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රධාන ලේකම් වූද ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙකු වූද විජේ ඩයස් සහෝදරයා විසින් කෙරෙනු ඇත. මෙම රැස්වීමට පැමිනෙන ලෙස කම්කරුවන්, තරුන ජනයා සහ බුද්ධිමතුන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

**දිනය හා වේලාව: 2006 ජනවාරි 05 සවස 4.30**

**ස්ථානය: කොලඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාරය**

© www.wsws.org